**ආයුර්වේද වෛද්‍ය සභාව - 2019**
**-----------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෛද්‍ය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෛද්‍ය සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වෛද්‍ය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වෛද්‍ය සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ වෛද්‍ය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 132 ඡේදය ප්‍රකාරව, සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, සභාව වෙත ලැබෙන රාජ්‍ය ප්‍රදාන ගිණුම්කරණයට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට වෛද්‍ය සභාවට ලැබෙන රාජ්‍ය ප්‍රදාන ගිණුම්කරණයට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලදී එසේ සිදුකර නොතිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂ ගැලපුම් ගිණුමක් පැවති අතර එම ගිණුමේ එදිනට හර ශේෂය වූ රු.131,462 ක් ශුද්ධ වත්කම්වලින් අඩුකර දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී පෙර වර්ෂ ගැලපුම් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 86 (ඇ) ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණවලට අදාළ ක්ෂය අනුපාතය හෝ ඵලදායී ජිවිත කාලය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රමිතයේ සඳහන් -එම- පරිදි අදාළ තොරතුරු ඉදිරිපත් කරන බව. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කර නොතිබුණු කාර්යාල උපකරණවල පිරිවැය රු.871,379 ක් හා සමුච්චිත ක්ෂය රු.818,206 ක් පොත්වලින් ඉවත් කර තිබුණි. | කාර්යාල උපකරණවල පිරිවැය රු.871,379 ක් හා සමුච්චිත ක්ෂය රු.818,206 ක් පොත්වලින් ඉවත් කර ඇති බව, ඉන් වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ භාණ්ඩ වෙන්දේසි නොවීම නිසා රු.44,568 ක අලාභයක් ගිණුම් ගත වි ඇති බව, මෙම භාණ්ඩ නැවත වෙන්දේසියට යොමු කරන බව හා 2020 වර්ෂයේ යම් කිසි ආදායමක් ලැබුණහොත් අදාළ ගැලපිම් සිදු කිරීමට කටයුතු කරන බව. | මෙම වැරදි නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ මාසික ලාභය රු.180,000 ඉක්මවන විටදී රු.1,800 ක මාසික දිරි දීමනාවක්ද, වැඩිවන සෑම 10,000 කටම සියයට 0.5 ක් ලෙස උපරිමය රු.2,800 ක මාසික දිරි දීමනාවක්ද සභාවේ නිලධාරීන්ට ගෙවීමට 2015 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණි. නමුත් එවැනි ලාභයක් ලැබී නොතිබුණු 2015 හා 2016 වර්ෂවලදී මෙන්ම ඌනතාවයක් ලැබී තිබුණු 2017, 2018 හා 2019 වර්ෂවලදී, මාසික ආදායම පදනම් කර ගෙන රු.1,711,408 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | මේ සම්බන්ධව 2020 ජනවාරි 29 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපතිවරයා විසින් සිදු කළ සාකච්ඡාවේදී ලාභය වෙනුවට ආදායම් පදනම් කර ගනිමින් මෙම ගෙවීම් කිරීමට එකඟතාවය පළකරන ලද බව හා ඒ සඳහා අනුමැතිය ලද විගස ඒ බව විගණකාධිපති වෙත යොමු කරන බව. | විධිමත් අනුමැතිය සහිත දිරි දීමනා පමණක් ගෙවිය යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටස** | | | |
| | (i) 11 (1) (ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කර ගනු ලැබූ සමාජිකයින් තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම සාමාජිකයින් තිදෙනා පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචිය අලුත් කරන ලද ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයින් පමණක් වලංගු ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයින් ලෙස සලකා 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 11 (1) (ඉ) වගන්තිය අනුව ඡන්ද විමසීමේ කටයුතු සිදුකිරිමට 2018 ඔක්තෝබර් 23 දින රැස් වූ වෛද්‍ය සභාව විසින් තීරණය කළ බව හා ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 18 (ඇ) හා (ඈ) (i) වගන්ති | මධ්‍යම රජයේ හා පළාත් සභා මට්ටමින් බඳවා ගනු ලබන ආයුර්වේද ඖෂධ සංයෝගකයන් හා ආයුර්වේද සාත්තු සේවකයන්ගේ නම් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සභාව වගකිව යුතු බල මණ්ඩලයක් ලෙස ක්‍රියා කළ යුතු වුවත්, මධ්‍යම රජයේ හා පළාත් සභා මට්ටමින් බඳවා ගනු ලබන එම තැනැත්තන් අනිවාර්යයෙන්ම සභාවේ ලියාපදිංචි කරවීම සඳහා විධිමත් | පළාත් සභා මට්ටමින් බඳවා ගනු ලබන ආයුර්වේද සාත්තු සේවකයින් හා ආයුර්වේද ඖෂධ සංයෝගකයන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීම සම්බන්ධ වැඩ පිළිවෙලක් සභාව විසින් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බව, මේ පිළිබඳ ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානය යොමු කරමින් සුදුසු වැඩපිළිවෙලක් සකස් | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | කිරිමට කටයුතු කරන බව. | |
| | | (ii) 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචි හෙද නිලධාරීන් සංඛ්‍යාව 38 ක් හා හෛසජ්ජකවරුන් සංඛ්‍යාව 260 ක් වන බව තහවුරු කර තිබුණි. නමුත් ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරිමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම නිලධාරින් සංඛ්‍යාව යාවත්කාලීන වි නොතිබුණු බවත්, ඒ තුළ විශ්‍රාම ගිය, මියගිය හා සේවය හැරගිය හෙද නිලධාරින් හා හෛසජ්ජකවරුන් සිටිය හැකි බවත් නිරික්ෂණය විය. | හෙද නිලධාරින් හා හෛසජ්ජකවරුන් සංඛ්‍යාව යාවත්කාලීන කිරිම පිළිබඳ අවධානය යොමු කරමින් ඉදිරියේදී කටයුතු කරන බව. | -එම- |
| (ආ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | සභාවේ ලියාපදිංචි සියලුම වෛද්‍යවරුන් වර්ෂ 05කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය වර්ෂ 05 ඉක්ම වූ වෛද්‍යවරු 15,045 ක් ලියාපදිංචිය අලුත් කර නොතිබුණි. ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව සභාවට අහිමිව තිබුණු ආදායම රු.මිලියන 18.83 ක් විය. | මේ සම්බන්ධව අදාළ වෛද්‍යවරුන් දැනුවත් කර ඇති බව, ඇතැම් වෛද්‍යවරුන්ගෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබීම නිසා ලියාපදිංචිය අළුත් කර නොමැති වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සභාව මඟින් කිසිදු කාර්යයක් ඉටු නොකිරීමට, කිසිදු පුහුණු පාඨමාලාවකට යොමු නොකිරීමට, අවුරුදු ලිත් ලබා නොදීමට හා 2019 වර්ෂයේ සිට වර්ෂයකට රු.300 බැගින් ප්‍රමාද ගාස්තුවකට යටත් කිරීමට තීරණය කර ඇති බව හා ඒ අනුව | වෛද්‍යවරුන් ලියාපදිංචිය යාවත්කාලීන කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලියාපදිංචිය අළුත් කිරීමේ වර්ධනයක් පෙන්නුම් කර ඇති බව. | |
| **(ඈ)** | ආයතන සංග්‍රහයේ XXI වැනි පරිච්ඡේදය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 137,138 හා 454 | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිල ඇඳුම් හිමි නොවන නිලධාරීන් 14 දෙනෙකු වෙත ලබාදීම සඳහා 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් රු.95,800 ක් හා රු.145,680 ක් වැය කර ඇඳුම් මිලදී ගෙන තිබුණි. තවද ඇඳුම් ලැබීම් හා නිකුත් කිරීම් බඩු ලේඛන පොත්වල සටහන් කර නොතිබුණි. එම ගෙවීම් අනුමත කළ හා සහතික කළ නිලධාරීන් විසින් භාණ්ඩ ලැබුණු බව හා තොග පොත්වලට ඇතුළත් කළ බව තහවුරු කර නොගෙන ගෙවීම් අනුමත කිරීම හා සහතික කිරීම සිදුකර තිබුණි. | ආයතන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා අංක 12/2012 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිතව යොමු කරන ලෙස 2019 ජූලි 23 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් දැනුම්දී ඇති බව, තවද එම නිල ඇඳුම් නිසි පරිදි භාරගත් බවට හා අදාළ නිලධාරීන් හා සේවකයින් විසින් ලබාගත් බවට අත්සන් සහිත ලේඛනයක් නඩත්තු කරන බව, එසේම පාරිභෝගික භාණ්ඩ පොතටද ඇතුළත් කිරිමට කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන නිලධාරින්ගෙන් මෙම වියදම අයිභාර කළ යුතුය. |
| (ඇ) | **2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** <br> **----------------------------** | | | |
| | (i) 9.3.1 වගන්තිය. | ලේඛකාධිකාරී තනතුරට අවශ්‍ය බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | සභාවට ලේඛකාධිකාරිවරයෙකු බඳවා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව. | ලේඛකාධිකාරී තනතුරට බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 6.5.3 වගන්තිය | 2018 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා 2019 මැයි 31 දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු නමුත් 2020 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | වෛද්‍ය සභාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා 2020 ජනවාරි 17 දින සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය වෙත යොමු කර ඇති බව. | අදාළ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වාර්තා සභාගත කළ යුතුය. |
| (ඉ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා පදනම මත පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), එය ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම හා ප්‍රතිඵල යනාදී විස්තර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණ ඇතුළත් කරමින් 2020 වර්ෂයේදී වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරිමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අපේක්ෂිත නිමැවුම/ප්‍රතිඵල ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.272,468 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,906,516 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,634,048 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු, වෙනත් ආදායම්, සාමාන්‍ය පොදු වියදම් හා වෙනත් වියදම් පිළිවෙලින් සියයට 46 කින්, සියයට 12කින් හා සියයට 39 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය සභාවේ ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරීන් හා හෙසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | කාර්ය සාධක දර්ශක පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම පිළිබඳ වෛද්‍ය සභාවේ අවධානය යොමු කරන බව. | කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂයේදී ව්‍යාජ වෛද්‍යවරුන් සම්බන්ධව පිළිවෙලින් පැමිණිලි 59 ක් හා පැමිණිලි 13 ක් ලැබී තිබුණි. ඉන් පිළිවෙලින් පැමිණිලි 56 ක හා 03 ක විමර්ශන කටයුතු 2020 ජූලි 03 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර විමර්ශන කටයුතු අවසන් කර තිබුණු පිළිවෙලින් පැමිණිලි 03 කට හා 10 කට අදාළව පසු විපරම් සිදුකර නොතිබුණි. ආයුර්වේද පනත හා විනය නියෝග කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කර නොතිබුණු බැවින් විමර්ශනය කළ බොහෝ පැමිණිලි අවවාද හා උපදෙස් ලබාදීම්වලට පමණක් සීමාවී තිබුණි. | 2019 නොවැම්බර් 28 දිනැති අංක PS/SP/SB/Circular/02/2019 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය අනුව වෛද්‍ය සභාවේ සියළු සාමාජිකයින් ඉල්ලා අස්වීමෙන් පසුව 2020 ජුනි 02 දින නැවත රැස්වීම හේතුවෙන් විමර්ශන කමිටුව රැස් කිරීමට නොහැකි වූ බව, නව සභාව රැස්වීමෙන් අනතුරුව එම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු ආරම්භකර 2020 වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කර ඇති බව, ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයින්ගේ වෘත්තිය විෂමාචාරයන් සිදුවීමේ බහුලතාවයක් පවතින බැවින් 1973 (විනය) නියෝගවලට අනුගත වෙමින් පනතේ 18(ඊ) වගන්තිය අනුව 2014 ඔක්තෝබර් 15 දින ගැසට් පත්‍රයේ පල කරන ලද රීති වල සිදුවිය යුතු සංශෝධන කිරීම සඳහා 2020 ජූලි 07 දින රැස්වූ වෛද්‍ය සභාව තීරණය කර ඇති බව. | ආයුර්වේද පනත හා විනය නියෝග කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කළ යුතු අතර සභාවට ලැබෙන වැදගත් සියළු පැමිණිලි විමර්ශනය කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකළ යුතු උපාය මාර්ග 10 කට අදාළ ක්‍රියාකාරකම් 05 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට අපොහොසත්වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර ගැනීමට සැලසුම් කරන ලද උපාය මාර්ගයකට අදාළ ක්‍රියාකාරකම් 03 ක භෞතික ප්‍රගතිය සියයට 10 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මග හැර ගනිමින් 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමටත් 2019 වර්ෂයේ ආරම්භ කිරීමට අපොහොසත් වූ කටයුතු ආරම්භ කිරීමටත් කටයුතු කරනු ලබන බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 101 ක ප්‍රමාදයක් සහිතව 2020 ජුනි 09 දින ඉදිරිපත් කර තිබුණි. | නව වෛද්‍ය සභා සමාජිකයින් පත්කිරීමෙන් පසු 2020 ජුනි 02 දින රැස් වූ පළමු රැස්වීමේදී වෛද්‍ය සභාවේ 2019 වර්ෂයේ අවසාන ගිණුම් අනුමත කළ බව හා එය 2020 ජුනි 09 දින විගණකාධිපති වෙත භාරදුන් බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව වෛද්‍ය සභාවේ විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දුන් බව. | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |